සියලු ම හිමිකම් ඇවිරිණි /All Rights Reserved

නව නිර්දේශය / New Syllabus

කලාප අධ්‍යාපන කාර්යාලය - ගම්පහ
අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2025
General Certificate of Education (Adv. Level) Examination – 2025
දෙවන වාර පරීක්ෂණය - Second Term Test

බෞද්ධ ශිෂ්ටාචාරය II
Buddhist Civilization

| 45 | S | II |
|---|---|---|

12 ශ්‍රේණිය
Grade 12

පැය තුනයි
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
Additional Reading Time - 10 minutes

උපදෙස්:

- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.
- I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

## I කොටස

01.

1. ක්ෂත්‍රිය වර්ණයට අයත් ස්වධර්ම **හතරක්** නම් කරන්න. (ල.02)
2. යාග **තුනක්** සැකෙවින් දක්වන්න. (ල.03)
3. බමුණු සම්ප්‍රදාය තුළ කාන්තාවගේ නිදහස සීමා කර තිබූ බවට සාධක **හතරක්** සැකෙවින් දක්වන්න. (ල.04)
4. අජිත කේසකම්බලි තුමාගේ ඉගැන්වීම් ගෙනහැර දක්වන්න. (ල.05)
5. අජිත කේසකම්බලි තුමාගේ ඉගැන්වීම් බුදුසමයෙන් බැහැර කරන්නේ කුමක් නිසාදැයි පෙන්වා දෙන්න. (ල.06)

02.

1. නිසි පරිදි යාග පැවැත්වීමට අවශ්‍ය කරන බමුණු පූජකවරුන් දක්වන්න. (ල.02)
2. ශ්‍රමණ ගුරුකුල **තුනක්** කෙටියෙන් හඳුන්වන්න. (ල.03)
3. බෞද්ධ චින්තනය තුළ කාන්තාව මවක් වශයෙන් ඇගයීමට ලක් වූ බවට සාධක **හතරක්** දක්වන්න. (ල.04)
4. අනාථපිණ්ඩික සිටුතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ **පහක්** පෙන්වා දෙන්න. (ල.05)
5. යහපත් පාලන තන්ත්‍රයක් ගොඩනගා ගැනීමෙහිලා සප්ත අපරිහානීය ධර්මවලින් ලැබිය හැකි දායකත්වය අගයන්න. (ල.06)

03.

1. බුදුන් වහන්සේ "අරහං" නාමයෙන් හැඳින්වීමට හේතු සාධක **දෙකක්** නම් කරන්න. (ල.02)
2. බුද්ධ චරිතයෙන් මහා කරුණාව ප්‍රකට වන බවට නිදසුන් **තුනක්** සැකෙවින් දක්වන්න. (ල.03)

සියලු ම හිමිකම් ඇවිරිණි /All Rights Reserved

3. බුද්ධ චරිතයෙන් ආදර්ශවත් නායකත්වය ප්‍රකට වන බවට සාධක **හතරක්** දක්වන්න. (ල.04)
4. බුද්ධකාලීන භාරතීය සමාජය වාණිජකරණයට ලක්ව පැවැති බවට සාධක **පහක්** දක්වන්න. (ල.05)
5. සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ගෙනහැර දක්වන්න. (ල.06)

## II කොටස

04.

1. බමුණු ආශ්‍රම ධර්ම සංකල්පය බුදු සමයෙන් ප්‍රතික්ෂේප කරන්නේ කුමක් නිසාදැයි පෙන්වාදෙන්න. (ල.10)
2. භාරතය ජනපද දහසයකට බෙදී යාමට මුල් වූ පසුබිම සැකෙවින් දක්වා, මහා රාජ්‍ය හතර පිළිබඳ විස්තරයක් කරන්න. (ල.10)

05.

1. වර්තමාන සමාජයේ ගැටලු අවම කරගැනීමෙහිලා පංචශීල ප්‍රතිපදාවෙන් ලැබෙන පිටිවහල පිළිබඳව විස්තර කරන්න. (ල.10)
2. දස රාජධර්ම යහපාලනයක් ගොඩනගා ගැනීමට ඉවහල් කරගත හැකි බව පෙන්වා දෙන්න. (ල.10)

06.

1. පුද්ගල ස්වාමිත්වය, ස්වාධීනත්වය හා ස්වච්ඡන්දතාවය බුදුසමය තුළ අගය කර ඇති බව පෙන්වා දෙන්න. (ල.10)
2. "**රටක් සංවර්ධනය කරා ගෙන යාමේදී එහි ප්‍රජාවගෙන් ද ඉටුවිය යුතු වගකීම් සමුදායක් ඇත**" මේ බව තහවුරු කරන්න. (ල.10)

07.

1. බුද්ධකාලීන භාරතයේ දියුණු කෘෂිකාර්මික ජීවන රටාවක් පැවැති බවට සාධක ගෙනහැර දක්වන්න. (ල.10)
2. බුද්ධකාලීන පාලකයින් හා බුදුන් වහන්සේ අතර පැවැති සබඳතාව පිළිබඳ විස්තරයක් කරන්න. (ල.10)

08.

1. බුද්ධ චරිතයෙන් ප්‍රකට වන **තාදී ගුණය** පිළිබඳ විධිමත් විස්තරයක් කරන්න. (ල.10)
2. පහත සඳහන් මාතෘකාවලින් **දෙකකට පමණක්** ප්‍රමාණවත් විස්තරයක් කරන්න. (ල.5×2= 10)
   i. චතුර් වර්ණ
   ii. පද්මාකාර ජීවිතය
   iii. රාජාණ්ඩු පාලන ක්‍රමයෙහි ලක්ෂණ
   iv. සතර සංග්‍රහ වස්තු